යොමු අංකය :- ගස/ස3/13/3/15
සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින්
2018 . 03 . 21 දින අනුමත කර ඇති බව
සහතික කරමි.
දිනය:- 2018 . 03 . 26 ආණ්ඩුකාරවර ලේකම්,
සබරගමුව පළාත.

**සබරගමුව පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහය**

**සංශෝධන පත්‍රිකා අංක 02**

01. සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ නියමය පරිදි සබරගමුව පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි සංශෝධනය කරමි.

**1. 7 ඡේදයේ 7.2.2.5.2 (ii) කොටස පහත පරිදි සංශෝධනය විය යුතුය.**

'අයදුම්පත් කැඳවනු ලබන දිනට අයදුම්කරු සබරගමුව පළාත තුළ ස්ථිර පදිංචි අයෙකු වියයුතු අතර, අයදුම්පත් කැඳවනු ලබන දිනට පූර්වාසන්න වසර 03තුළ අයදුම්කරුට සබරගමුව පළාතේ වසර 03ක ස්ථිර පදිංචිය නොමැත්තේ නම් අයදුම්කරුගේ කලත්‍රයා අයදුම්පත් කැඳවනු ලබන දිනට පූර්වාසන්න වසර 03ක කාලය තුළ සබරගමුව පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.'

02. රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහයට සමරූපීව සකස් කර ඇති සබරගමුව පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථාව, 2018 ජනවාරි මස 04 දිනැති අංක 2052/26 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සංශෝධන අංක 02 අනුව පහත දැක්වෙන පරිදි සංශෝධනය කරමි.

**1. 7 ඡේදයේ 7.3 සීමිත බඳවා ගැනීම යටතේ 7.3.2.1. කොටස පහත පරිදි සංශෝධනය විය යුතුය.**

7.3.2.1 අධ්‍යාපන සුදුසුකම්

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාව හා ගණිතය/ අංක ගණිතය/ශුද්ධ ගණිතය/මූලික ගණිතය/වාණිජ අංක ගණිතය ඇතුලුව විෂයයන් හයකින් (06) සමත්ව තිබීම

**2. ඇමුණුම 06 යටතේ අංක 02, අංක 04 හා අංක 05 කොටස්වල 'විභාගය' යන්න වෙනුවට 'කාර්යක්ෂමතා කඩඉම් විභාගය' ලෙස ආදේශ විය යුතුය.**

**3. ඇමුණුම 06 සඳහා අවසානයට අංක 06 ලෙස පහත කරුණු එක් කරනු ලැබේ.**

6. සබරගමුව පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු දැනුවත් වී සිටිය යුතු මූලික සිද්ධාන්ත අඩංගු දින 10කින් යුත් පාඨමාලාව I ශ්‍රේණියට උසස් වී වසර 05ක් ඇතුළත සාර්ථකව හදාරා නිම කිරීම මත I ශ්‍රේණියේ නිලධාරීන්ට නියමිත කාර්යක්ෂමතා කඩඉම් විභාග අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.

i. පාඨමාලාව පවත්වන බලධරයා : ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්

ii. පාඨමාලාව පවත්වනු ලබන කාල සීමාව : I ශ්‍රේණියට නියමිත පුහුණු පාඨමාලාවට අදාළව ඉල්ලුම්පත් කැඳවීම සඳහා වූ නිවේදනය සෑම වර්ෂයකම මුල් කාර්තුවේ දී ප්‍රසිද්ධියට පත් කරනු ලබන අතර ඒ සඳහා ලැබෙන ඉල්ලුම්පත් ප්‍රමාණය සළකා බැලීමෙන් අනතුරුව වර්ෂයකට පවත්වන වාර ගණන තීරණය කරනු ලබයි.

iii. පාඨමාලාවේ විෂය නිර්දේශය

| මොඩියුලය | කාලය |
|---|---|
| රාජ්‍ය සේවයේ විනය ක්‍රියා පටිපාටිය | දින 02 |
| රාජ්‍ය මූල්‍ය කළමනාකරණය හා වත්කම් කළමනාකරණය | දින 03 |
| සංවිධාන ඵලදායීත්වය | දින 02 |
| ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය | දින 02 |
| තොරතුරු දැන ගැනීමේ පනත හා පාරිභෝගික සත්කාරය | දින 01 |

සටහන:

01. ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය මත රාජ්‍ය සේවා පුහුණු ආයතනය මගින් පාඨමාලාව මෙහෙයවනු ලබන අතර අදාළ මොඩියුල පහම සාර්ථකව සම්පූර්ණ කිරීම මගින් පමණක් සබරගමුව පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ I ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් නිදහස් කරනු ලැබේ.

යොමු අංකය :- ආ/සප/13/3/15
සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින්
2018.03.21 දින අනුමත කර ඇති බව
සහතික කරමි.

දිනය:- 2018.03.26 ආණ්ඩුකාරවර ලේකම්,
සබරගමුව පළාත.

02. තව ද සබරගමුව පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ I ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කිරීම සඳහා ඉහත (01) කොටසින් දක්වා ඇති විභාගය සමත් වීම හෝ (06) කොටස මඟින් දක්වා ඇති පාඨමාලාවේ විෂය නිර්දේශය යටතේ ඇති මොඩියුල 05 ම සාර්ථකව සම්පූර්ණ කිරීම හැර විභාගයේ විෂයයන් හා පාඨමාලාවේ විෂයයන් ඒකාබද්ධ වූ විෂයෙන් විෂයට නිදහස් කිරීමේ පදනමක් මත කාර්යක්ෂමතා කඩඉමෙන් නිදහස් කිරීමක් කිසිසේත් සිදුකරනු නොලැබේ.

යොමු අංකය : DCS/PT/MA/02/026/2018

ලේකම්
සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

සබරගමුව පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සංශෝධන අංක 02 අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන:.......................................
නම:.......................................
ප්‍රධාන ලේකම්
සබරගමුව පළාත
නිලමුද්‍රාව :.......................................

හේරත් පී. කුලරත්න
ප්‍රධාන ලේකම්
සබරගමුව පළාත

දිනය: 2018.02.21

---

යොමු අංකය : PPSC/ES/05/FI/12/163

ආණ්ඩුකාරවර ලේකම්
සබරගමුව පළාත

සබරගමුව පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සංශෝධන අංක 02 අනුමත කිරීම සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලදී.

අත්සන:.......................................
නම:.......................................
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත
නිලමුද්‍රාව :.......................................

සුනේත්‍රා ගුණවර්ධන
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත
පළාත් සභා සංකීර්ණය - රත්නපුර

දිනය: 2018.3.08

---

යොමුඅංකය : .......................................

සබරගමුව පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සංශෝධන අංක 02 ....................... දින සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් විසින් අනුමත කරන ලදි.

අත්සන:.......................................
නම:.......................................
ආණ්ඩුකාරවර ලේකම්
සබරගමුව පළාත
නිලමුද්‍රාව :.......................................

දිනය: